# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත සෙසු නිල තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම (වෘත්තීය/ වෘත්තීය නොවන)

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත වෘත්තීය සහ වෘත්තීය නොවන තනතුරු සඳහා ආධුනික සෙබළ සෙබළියන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සහ අයදුම්කාරියන් මූලික සම්මුඛ පරීක්‍ෂණයට භාජනය කරනු ලබන අතර, ඉන් තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් සහ අයදුම්කාරියන් බඳවා ගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් වෛද්‍ය පරීක්‍ෂණයක් සඳහා යොමු කරවා ඉන් සමත් අයදුම්කරුවන් සහ අයදුම්කාරියන් රෙජිමේන්තු මධ්‍යස්ථාන සමඟ සම්බන්ධතාවයෙන් යුතුව පිරිස් පරිපාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙතින් ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බලහමුදාව වෙත ඇතුළත් කරනු ලබන අතර, එම සුදුසුකම් පහත සඳහන් පරිදි වේ :

අ. බඳවා ගැනීමේ මූලික සුදුසුකම්:

(1) මූලික සුදුසුකම් - පිරිමි:

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| (ආ) | විවාහක/ අවිවාහක බව | : | අවිවාහක. |
| (ඇ) | වයස | : | වෘත්තීය නොවන සෙබළ (2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු 24ට නොවැඩි විය යුතුයි). |
| | | : | වෘත්තීය සෙබළ (2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු 26ට නොවැඩි විය යුතුයි). |
| (ඈ) | උස | : | අඩි 5යි අඟල් 4ට නොඅඩු. |
| (ඉ) | බර | | 50 Kg නොඅඩු. |
| (ඊ) | පපුව | : | අඟල් 32ට නොඅඩු. |
| (උ) | දෘෂ්ටි තීව්‍රතාවය | : | 6/6 විය යුතුයි (උපැස් හෝ කාච රහිතව). |
| (ඌ) | ශරීර ස්කන්ධ දර්ශකය | : | 18 $Kg/m^2$ – 25$Kg/m^2$ ත් අතර විය යුතුයි. |

(2) මූලික සුදුසුකම් - කාන්තා:

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| (ආ) | විවාහක/අවිවාහක බව | : | අවිවාහක. |
| (ඇ) | වයස | | වෘත්තීය නොවන සෙබළ (2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු 22ට නොවැඩි විය යුතුයි). |
| | | : | වෘත්තීය සෙබළ (2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු 26ට නොවැඩි විය යුතුයි). |
| (ඈ) | උස | : | අඩි 5යි අඟල් 2ට නොඅඩු. |
| (ඉ) | බර | : | 40 Kg නොඅඩු. |
| (ඊ) | දෘෂ්ටි තීව්‍රතාවය | : | 6/6 විය යුතුයි (උපැස් සහ කාච රහිතව). |
| (උ) | ශරීර ස්කන්ධ දර්ශකය | : | ( 18 $Kg/m^2$ – 25$Kg/m^2$ ත් අතර විය යුතුයි. |

ආ. වෘත්තීය නොවන රාජකාරී:

(1) මූලික අධ්‍යාපන සුදුසුකම් - 10 ශ්‍රේණිය සමත් වීම හෝ පිරිවෙන් අධ්‍යාපනය 05 ශ්‍රේණිය සමත් වී සිටිය යුතුයි.

ඇ. වෘත්තීය රාජකාරී:

(1) මූලික අධ්‍යාපන සුදුසුකම් - 10 ශ්‍රේණිය සමත් වී සිටීම හෝ 05 ශ්‍රේණිය (පිරිවෙන් අධ්‍යාපනය ) සමත් වී සිටිය යුතුයි. තවද, මූලික සුදුසුකම්වලට අමතරව ජාතික වෘත්තීය නිපුණතා සහතිකය (NVQ) ලබා ඇති අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් පහත සඳහන් පරිදි සලකා බලනු ලබන අතර, එම සහතිකපත් හිමි අයදුම්කරුවන්ද යුද්ධ හමුදාව වෙත වෘත්තීය ආධුනිකයින් ලෙස බඳවාගනු ලැබේ. (එක් එක් වෘත්තියට අනුව අධ්‍යාපන සුදුසුකම් වෙනස් විය හැකිය):

(අ) NVQ III - අ.පො.ස. (සා/පෙළ) සමත් වීම හා සමාන වේ.
(ආ) NVQ IV - අ.පො.ස. (උ/පෙළ) සමත් වීම හා සමාන වේ.

ඇ. වෘත්තීය රාජකාරි සඳහා තිබිය යුතු සුදුසුකම් හා පළපුරුද්ද :

(1) *සූප සහයක* - සියලු රෙජිමේන්තු : (ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය හැර)

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 03ක වෘත්තීයට අදාළ සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) වෘත්තියට අදාළව මාස 06ක පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

(2) *රියදුරු (මෝටර් ප්‍රවාහන)* - සියලු රෙජිමේන්තු: (ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය හැර)

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) බර හෝ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රය සහිත වීම.
(ඈ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක රියදුරු වෘත්තියට අදාළ මාස 06ක හෝ ඊට වැඩි පළපුරුද්දක් සහිත විය යුතුය.
(ඉ) ජංගම අලුත්වැඩියාවන් ගැන දැනුමක් ඇති අය විශේෂ සුදුසුකමක් ඇති අයවලුන් සේ සලකනු ලැබේ.

(3) *පරිපාලන සහයක* - සියලු රෙජිමේන්තු (ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය හැර) :

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් දෙකක් (02) සඳහා සම්මාන සහිතව සිංහල, දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයන් 06කින් සමත් වීම.
(ඇ) අවම වශයෙන් මාස 03ක රජයේ හෝ රජයේ ලියාපදිංචි අයතනයක පරිගණක, සිංහල හෝ ඉංග්‍රීසි යතුරු ලියන පාඨමාලාවක් හදාරා ඉන් සමත් වී තිබිය යුතුය.
(ඈ) අ.පො.ස (උ/පෙළ) සඳහා පෙනී සිටීම සහ ඉංග්‍රීසි භාෂාව සඳහා ඇති නිපුණත්වය විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(4) *ද්‍රව්‍ය කළමනාකරණ සහයක* - සියලු රෙජිමේන්තු (ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය සහ ශ්‍රී ලංකා යුධ හමුදා සේවා බලකාය හැර)

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් දෙකක් (02) සඳහා සම්මාන සහිතව සිංහල, දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත් වීම.
(ඇ) ගබඩාකරු පාඨමාලාවක් හෝ ඊට සමගාමී වෙනත් පාඨමාලාවක්, සිංහල හෝ ඉංග්‍රීසි යතුරු ලියනය කිරීම හා පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) ගබඩාකරණය පිළිබඳ මාස 06ක පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

(5) *වඩු කාර්මික සහායක* .- සියලු රෙජිමේන්තු : (ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය හැර)

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 03 වෘත්තියට අදාළ පාඨමාලාවක් හදාරා තිබීම *හෝ* වෘත්තියට අදාළව NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) වඩු කාර්මික වෘත්තියට අදාළව මාස 06ක පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

(6) *සංස්කෘතික නර්ථන ශිල්පීන්* .- සියලු රෙජිමේන්තු: (ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය හැර)

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු අතර (කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 22ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) පෙරදිග හා අපරදිග සහතිකලත් නර්ථන පාඨමාලා හදාරා තිබීම.
(ඈ) ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංස්කෘතික තූර්යවාදක ඛණ්ඩයේ අණදෙන නිලධාරීගේ මූලික සම්මුඛ පරීක්ෂණයෙන් පසු නිර්දේශ මත බඳවා ගැනේ.

(7) *සන්නද්ධ රථ සංඥා වෙඩිකරු*.- ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය සහ ශ්‍රී ලංකා යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(8) *සන්නද්ධ රථ රියදුරු* .- ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය සහ ශ්‍රී ලංකා යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) බර වාහන හෝ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රයක් සහිත වීම.
(ඈ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක රියදුරු වෘත්තියට අදාළ මාස 06ක හෝ ඊට වැඩි පළපුරුද්දක් සහිත වීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(9) *කාලතුවක්කු සහාය කාර්මික* .- ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව :

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් දෙකක් (02) සඳහා සම්මාන සහිතව සිංහල සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත් වීම.

(10) ක්ෂේත්‍ර ඉංජිනේරු සහායක - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(11) *යන්ත්‍ර ක්‍රියාකරු සහායක* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය :

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) රජයේ හෝ පිළිගත් ආයතනයක් වෙතින් පවත්වනු ලැබූ වෘත්තීය පරීක්ෂණයකින් සමත් වී ඇති බවට සහතික පත්‍රයක් තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් ආයතනයක වසර 01ක සේවා කාලයක් අදාළ වෘත්තියෙහි නියැලී තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(12) *යන්ත්‍ර වැද්දුම්කරු / වැද්දුම්කරු* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් ආයතනයක මාස 03කට නොඅඩු වෘත්තීය සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) යන්ත්‍ර වැද්දුම්කරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(13) *ඉදිකිරීම් කාර්මික* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) ඉදිකිරීම් කාර්මික වෘත්තිය පිළිබඳව පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඉදිකිරීම් කාර්මිකයෙකු වශයෙන් මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(14) *රියදුරු (ක්‍රියාකරු)* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ පිළිගත් ආයතනයකින් මාස 03කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ඇති බවට පිළිගත් ආයතනයකින් ලබා දී ඇති සහතිකය.
(ඈ) රියදුරු ක්‍රියාකරු වෘත්තියේ වසර 01කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

(15) *මූර්ති ශිල්පී* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ පිළිගත් ආයතනයකින් මාස 03කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ඇති බවට පිළිගත් ආයතනයකින් ලබා දී ඇති සහතිකය.
(ඈ) මූර්ති ශිල්පී වෘත්තියේ වසරක හෝ වසර 02ක පළපුරුද්දක් තිබිය යුතුය.

(16) *වාහන වායුසමීකරණ ක්‍රියාකරු* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) පිළිගත් වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) වාහන වායුසමීකරණ ක්‍රියාකරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් සහිත වීම.

(17) *මිනින්දෝරු සහායක* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය :

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස (සා/පෙළ) විෂයයන් 02ක් සමත් වීම.
(ඇ) රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වසර 01ක පළපුරුද්ද හෝ බලයලත් මිනින්දෝරුවෙකු යටතේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

(18) *ජලනල කාර්මික* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) වෘත්තීයට අදාළ රජයේ හෝ පිළිගත් ආයතනයක් වෙතින් සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ වෘත්තියේ මාස 06කට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(19) *විදුලි කාර්මික* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) සහතිකලත් වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.
(ඇ) විදුලි කාර්මික වෘත්තියේ මාස 6 ක පළපුරුද්ද.

(20) *සැලසුම් ශිල්පී* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල, දෙමළ භාෂාව සහ ගණිතය විෂයයන් ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 සමත් වීම.
(ඇ) රජයේ කාර්මික විද්‍යාලයක ආධුනික සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම හා රජයේ පිළිගත් ආයතනයක් වෙතින් සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(21) *කම්මල්කරු* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) වෘත්තීයට අදාළ මාස 03කට නොඅඩු සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඇ) කම්මල්කරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් සහිත වීම.

(22) *පෑස්සුම්කරු* - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 03කට නොඅඩු පිළිගත් වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.
(ඇ) NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.
(ඉ) පෑස්සුම්කරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් සහිත වීම.

(23) ලෝහ තහඩුකරු - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 06කට නොඅඩු වෘත්තිය පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.
(ඉ) ලෝහ තහඩුකරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් සහිත වීම.

(24) වාහන පින්තාරු සහයක - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ පිළිගත් ආයතනයකින් මාස 03කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම, NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකයක් ලබා තිබීම.
(ඈ) පිළිගත් ආයතනයක් වෙතින් මාස 06ක වාහන පින්තාරු සේවා පළපුරුද්දක් ඇති බවට ලබාදී ඇති සහතිකය.

(25) වාහන කාර්මික ශිල්පී - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක පාඨමාලාවක් හදාරා තිබීම, NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකයක් ලබා තිබීම.
(ඈ) වාහන කාර්මික ශිල්පී වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(26) මෙවලම් කාර්මික - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය. .
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් දෙකකට සම්මාන සහිතව සිංහල භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් 06කින් සමත් වීම.
(ඇ) වෘත්තිය සම්බන්ධව NVQ Level III හෝ ඉන් ඉහළ සහතිකයක් ලබා ඇත්නම් අ.පො.ස. (සා/පෙළ) සඳහා පෙනී සිටීම ප්‍රමාණවත් වේ.
(ඈ) අදාළ වෘත්තිය පිළිබඳ රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු වෘත්තිය පාඨමාලාවක් හදාරා තිබීම
(ඉ) මෙවලම් කාර්මික වෘත්තියේ වසරකට වැඩි පළපුරුද්දක් ලබා තිබීම හෝ NVQ LEVEL III සහතිකයක් ලබා ඇත්නම් මාස 06ක පළපුරුද්ද ප්‍රමාණවත් වේ.

(27) රියපෙට්ටි සැකසුම්කරු - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
(ඉ) රියපෙට්ටි සැකසුම්කරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(28) ලියවන වඩු කාර්මික (පොදු) - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
(ඉ) ලියවන වඩු කාර්මික වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(29) දත්ත ප්‍රවේශ ක්‍රියාකරු - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් දෙකක් (02) ක් සඳහා සම්මාන සහිතව සිංහල, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත් වීම.
(ඇ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 03කට නොඅඩු පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) අ.පො.ස (උ/පෙළ) විභාගය සඳහා පෙනීසිටීම සහ ඉංග්‍රීසි භාෂාව සඳහා ඇති නිපුණත්වය විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(30) දෘඩාංග කාර්මික - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් දෙකක් සඳහා සම්මාන සහිතව සිංහල, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත් වීම.
(ඇ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 03කට නොඅඩු පරිගණක දෘඩාංග හා ජාලකරණ කාර්මීකරණය පිළිබඳ පිළිගත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) දෘඩාංග කාර්මික ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(31) ගුවන්විදුලි කාර්මික සහ විදුලි පණිවුඩ කාර්මික - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) පිළිගත් ආයතනයකින් ඉලෙක්ට්‍රොනික් හෝ විදුලි සංදේශ කාර්මික සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) පිළිගත් ආයතනයක හෝ සමාගමක ඉලෙක්ට්‍රොනික්, විදුලි සංදේශ කාර්මික වෘත්තියේ මාස 06කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

(32) පරිගණක කාර්මික - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සාපෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් තුනකට (03) සම්මාන සහිතව සිංහල, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළු විෂයයන් 06ක් සමත් වීම.
(ඇ) රජයේ ලියාපදිංචි හෝ පිළිගත් කාර්මික විද්‍යාලයකින් හෝ පරිගණක පුහුණු ආයතනයකින් මාස 03කට හෝ ඊට වැඩි කාලයක පරිගණක කාර්මික පාඨමාලාවක් (Hardware Network) හෝ ඊට සමාන පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) පරිගණක කාර්මික වෘත්තියේ ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(33) ජාලකරණ කාර්මික - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සාපෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් තුනකට (03) සම්මාන සහිතව සිංහල, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයන් ඇතුළු විෂයයන් 06ක් සමත් වීම.
(ඇ) රජයේ ලියාපදිංචි හෝ පිළිගත් කාර්මික විද්‍යාලයකින් හෝ පරිගණක පුහුණු ආයතනයකින් මාස 03කට හෝ ඊට වැඩි කාල සීමාවක පරිගණක කාර්මික පාඨමාලාවක් (Hardware Network) හෝ ඒ සමාන පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) ජාලකරණ කාර්මික වෘත්තියේ ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(34) ගුවන්විදුලි කාර්මික සහ විදුලි සංදේශ කාර්මික - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) පිළිගත් ආයතනයකින් ඉලෙක්ට්‍රෝනික, විදුලි සංදේශ කාර්මික සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.

(35) සයිබර් ආරක්‍ෂණ ක්‍රියාකරු - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව සිංහල, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයන් ඇතුළුව විෂයයන් හයකින් (06) සමත් වීම.
(ඇ) රජයේ ලියාපදිංචි හෝ පිළිගත් කාර්මික විද්‍යාලයකින් හෝ පරිගණක පුහුණු ආයතනයකින් මාස හයක හෝ ඊට වැඩි කාලයක සහතිකලත් පරිගණක පාඨමාලාවක් (Ms Office, Ms Excel, Ms Power Point, Graphic Designing, Digital Animation , Corel Draw, Special Effects , Crative Designing, 3D Advertising, Web Designing, Auto Cad) හෝ ඒ සමාන පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම; හා
(ඈ) වෘත්තිය පළපුරුද්ද හා සයිබර් ආරක්‍ෂණය පිළිබඳව හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(36) ගුවන්විදුලි යන්ත්‍ර ක්‍රියාකරු - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(37) සංඥා මධ්‍යස්ථාන ක්‍රියාකරුවන් සහ දුරකථන ක්‍රියාකරුවන් - ශ්‍රී ලංකා සංඥා බලකාය :

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(38) දුරකථන මාර්ග නඩත්තුකරු - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(39) දුරකථන කාර්මික - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(40) බෙදාහැරීම් ආරෝහක - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) අයදුම්කරුවන් හට බර වාහන හෝ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර සහිතව රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 06ක හෝ ඊට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය.

(41) ද්‍රව්‍ය කළමනාකරණ සහායක (සැපයුම්) - ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 03ක් සඳහා සම්මාන සහිතව සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත් විය යුතුයි.
(ඇ) ද්‍රව්‍ය කළමනාකරණ සහායක වෘත්තිය පිළිබඳව මාස 06ක පළපුරුද්දක් ලබා තිබීම.

(42) සහාය බේකරි ශිල්පී - ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) බේකරි වෘත්තිය පිළිබඳව මාස 06ක පළපුරුද්දක් ලබා තිබීම.

(43) ගිනි නිවුම්කරු - ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) පිළිගත් ආයතනයක ගිනි නිවීම පිළිබඳව මාස 03ක පළපුරුද්දක් ලබා තිබීම.

(44) දන්ත ශල්‍යාගාර සහායක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස (උ/පෙළ) ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනම (03) එකවර සමත් වීම හෝ අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වීම.

(45) හෙද නිලධාරි - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයන් හදාරා විෂයන් 03ක් එක්වර සමත් වීම.
(i) ජීව විද්‍යාව විෂය ධාරාවට අයත්: ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)
(ii) භෞතික විද්‍යා විෂය ධාරාවට අයත්: සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා උසස් ගණිතය යන විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)
(ඇ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂය අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 06කින් සමත් වීම.

(46) විද්‍යුත් නිකර්පන රේඛණ සටහන්කරු - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් 02ක් එක් වරක දී සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළත්ව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් සමත් වීම.

(47) බන්තුක රේඛණ ශිල්පී - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් 02ක් එක් වරක දී සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළත්ව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් සමත් වීම.

(48) ශල්‍යාගාර කාර්මික ශිල්පී - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගය විද්‍යා විෂයය ධාරාවෙන් හදාරා විෂයයන් 02ක් එකවරක දී සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ද ඇතුළත්ව විෂයයන් 06කින් සමත් වී තිබීම.

(49) භෞත චිකිත්සක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 02ක් සහිතව විෂයයන් තුනම එක් වරක දී සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් 06කින් සමත් වී තිබීම හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව සමත් වී තිබීම.

(50) විකිරණ ශිල්පී - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 02ක් සහිතව විෂයයන් තුනම එක් වරක දී සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් 06කින් සමත් වී තිබීම හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව සමත් ව තිබීම.

(51) වෛද්‍ය සහායක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 06ක් සමත් වීම හා ඕනෑම විෂයන් 04කට සම්මාන සාමාර්ථ ලබා තිබීම.
(ඇ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂයය ධාරාවකින් සමත්ව තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(52) අක්ෂි තාක්ෂණවේදී - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් 02ක් එක්වරක දී සමත් වීම.
(ඇ) අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළත්ව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් සමත් වීම.

(53) පාසල් දන්ත චිකිත්සක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් 02ක් සහිතව විෂයයන් 03ක් එකවරක දී සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් සමත් වීම.

(54) දන්ත කාර්මික - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගය ප්‍රතිඵල මත ඇතුළත් වන්නේ නම් ඕනෑම විෂයය ධාරාවකින් විෂයයන් තුනක් (03) එකවර සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල මත ඇතුළත් වන්නේ නම් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

(55) මහජන සෞඛ්‍ය පරීක්ෂක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව හෝ සංයුක්ත ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයයන් අතරින් 02ක් එක්වරක දී සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වීම.

(56) අංගාදේශක හා සෘජුකරණ ශිල්පී - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂයයන් අතරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනක් එක් වරක දී සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වීම.

(57) පරිපාලන සහායක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/ කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් හයක් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම හා ඕනෑම විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ ලබා තිබීම.
(ඇ) අ.පො.ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂයය ධාරාවකින් හදාරා සමත්ව තිබීම.

(58) ද්‍රව්‍ය කළමනාකරණ සහායක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා පෙනී සිටීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම.
(ඈ) ගබඩාකරු පාඨමාලාව හා ඊට සමගාමී වෙනත් පිළිගත් පාඨමාලා, සිංහල හෝ ඉංග්‍රීසි යතුරු ලියනය කිරීම හා පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම හෝ ගබඩාකරණය පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුයි.

(59) සන්නාලි - ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුද්ධෝපකරණ බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) ඇඳුම් කැපීම, ඇඳුම් මැසීම, පතරොම් සැකසීම පිළිබඳ අවම වශයෙන් මාස 06කට නොඅඩු පළපුරුද්ද තිබීම හෝ වෘත්තියට අදාළව සේවා සහතිකයක් ලබා තිබීම.

(60) සපත්තු සැදුම්කරු - ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුද්ධෝපකරණ බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) පිළිගත් ආයතනයක වෘත්තියට අදාළව මාස 06ක පළපුරුද්ද සහිත සේවා කාලයක් තිබීම.

(61) වායු සමීකරණ හා ශීතකරණ කාර්මික - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක පාඨමාලාවක් නිමකර තිබීම හෝ NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකපත්‍රයක් ලබා තිබීම.
(ඈ) වායුසමීකරණ හා ශීතකරණ කාර්මික වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(62) ඉලෙක්ට්‍රොනික් උපකරණ කාර්මික ශිල්පී - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකර තිබීම හෝ NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතික පත්‍රයක් ලබා තිබීම.
(ඈ) මාස 06කට නොඅඩු වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(63) ජීව වෛද්‍ය උපකරණ කාර්මික - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 02ක් සඳහා සම්මාන සහිතව සිංහල හෝ දෙමළ භාෂාව හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 06ක් සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි විෂයය සමත්ව තිබීම හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා පෙනී සිටීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.
(ඈ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඉ) ජීව වෛද්‍ය උපකරණ කාර්මික වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(64) අව්ගාරක - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(65) පරිගණක දෘඩාංග ශිල්පී - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය :

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 02ක් සඳහා සම්මාන සහිතව සිංහල හෝ දෙමළ භාෂාව හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත් වීම.
(ඇ) මාස 03කට වැඩි පරිගණක දෘඩාංග පාඨමාලාවක්, ඉලෙක්ට්‍රොනික් පාඨමාලාවක්, පරිගණක දෘඩාංග සහ ජාලකරණ පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) පරිගණක දෘඩාංග කාර්මික හෝ ඉලෙක්ට්‍රොනික් කාර්මික/ පරිගණක ජාලකරණ කාර්මික ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

(66) ආපදා රථ ක්‍රියාකරු (ඒ හා බී වාහන) - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) බර වාහන හෝ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර සහිත රජයේ ලියාපදිංචි ආයතනයක මාස 06කට නොඅඩු රියදුරු වෘත්තියේ පළපුරුද්දක් ලබා තිබීම.

(67) පරිපාලන සහායක (ගිණුම්) - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) ලාන්ස් කෝප්‍රල් (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ 03ක් සහිතව ගණිතය විෂය ඇතුළුව විෂයන් හයකින් (06) සමත් වී තිබීම හා අ.පො.ස. (උ/පෙළ) විෂයයන් දෙකකින් සමත් ව තිබීම (වාණිජ සහ ගණිත අංශයෙන් සමත් අයවළුන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ).

(ඈ) ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පී ආයතනයේ (AAT) II වන අදියර සමත් වීම හෝ

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණික අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා 2 වන වසර සමත් වීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CASL) විසින් පවත්වනු ලබන විධායක අදියර (Executive Level) සමත් වීම (පැරණි නිර්දේශ යටතේ ගිණුම්කරණ හා ව්‍යාපාර සහතික I - (Certificate In Accounting and Bussiness I)

හෝ

පදනම් අදියර (Foundation Leval) සමත් වීම හෝ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CMA) විසින් පවත්වනු ලබන පදනම් විභාගය (Foundation Exam)

හෝ

පැරණි නිර්දේශය යටතේ පැවති තාක්‍ෂණික අදියර (Technical Stage) සමත් වීම හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරී ආයතනයේ (CIMA) සහතික අදියර (Certificate Level) සමත් වී තිබීම

හෝ

පිළිගත් ගණකාධිකරණ වෘත්තිය අධ්‍යාපන ආයතනයක ගණකාධිකරණය පිළිබඳ වෘත්තිය පාඨමාලාවක් හදාරා තිබීම.

(68) පරිපාලන සහායක (ගිණුම්) - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ 03ක් සහිතව ගණිතය විෂය ඇතුළුව විෂයයන් 06ක් සමත් වී තිබීම.
(ඇ) අ.පො.ස. (උ/පෙළ) විෂයයන් දෙකකින් සමත්ව තිබීම. (වාණිජ සහ ගණිත අංශයෙන් සමත් අයවළුන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ)
(ඈ) ගිණුම්කරණය සම්බන්ධ පාඨමාලා හදාරා තිබීම, පරිගණක ආශ්‍රිතව ඉංග්‍රීසි/ සිංහල භාෂාවෙන් ලිපි සැකසීමේ හැකියාව.
(ඉ) ගිණුම්කරණ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(69) කනිෂ්ඨ පරිපාලන සහායක (විගණන) - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) ලාන්ස් කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල සහ ගණිතය විෂයය ඇතුළුව විෂයන් 06ක් සම්මාන සාමාර්ථ 03ක් සහිතව සමත් වීම.
(ඇ) අ.පො.ස.(උ/පෙළ) විභාගය සමත්ව තිබීම. (වාණිජ හා ගණිත අංශයෙන් සමත් අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණික අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා 2 වන වසර සමත් වීම

හෝ

ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ (AAT) II අදියර සමත් වීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (ICASL) විසින් පවත්වනු ලබන ගිණුම්කරණය හා ව්‍යාපාර සහතිකය I - (Certificate In Accounting and Bussiness I) හෝ පැරණි නිර්දේශය යටතේ පැවති පදනම් විභාගය (Foundation Exam) සමත් වීම

හෝ

සහතිකලත් කලමණාකරණ ගණකාධිකාරී ආයතනය (CMA) විසින් පවත්වනු ලබන පදනම් විභාගය (Foundation Exam) හෝ පැරණි නිර්දේශය යටතේ පැවති තාක්‍ෂණික අදියර (Technical Stage) සමත් වීම.

(ඈ) පිළිගත් ආයතනයක් වෙතින් පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම හා සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පරිගණක වැඩ කිරීමේ හැකියාව අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

(70) කනිෂ්ඨ පරිපාලන සහායක (විගණන) - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල සහ ගණිතය විෂයය ඇතුළුව විෂයයන් 06ක් සම්මාන සාමර්ථ 03ක් සහිතව සමත් වීම හා අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්ව තිබීම. (වාණිජ හා ගණිත අංශයෙන් සමත් අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ)

(ඇ) විගණන/ගිණුම්කරණය සැබැඳි පාඨමාලා හදාරා තිබීම හා පරිගණක ආශ්‍රිතව ඉංග්‍රීසි/ සිංහල භාෂාවෙන් ලිපි සැකසීමේ හැකියාව.

(ඈ) විගණන ක්ෂේත්‍රයෙහි පළපුරුද්දක් ලබා ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(71) බැග් පයිප් වාදක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම හා බටහිර සංගීත ප්‍රස්ථාර ලිවීමේ/ කියවීමේ හැකියාව.

(72) අපරදිග තූර්යවාදක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු අතර (කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 22ට නොවැඩි විය යුතුය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම හා ක්ලැරිනට්, ට්‍රම්පට්, කෝනට්, සැක්සෆෝන්, ට්‍රම්බෝන්, ටියුබා, ඉයුෆෝනියම්, බේස්, හෝන්, ෆෝපුට්, ඩ්‍රම්ස් යන සංගීත භාණ්ඩවලින් 01ක් හෝ කිහිපයක් වාදනය කිරීම සහ සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ හා හින්දි භාෂාවලින් ගීත ගායනා කිරීමේ හැකියාව සහ ඕගන් ගිටාර් ඉතා දක්ෂ ලෙස වාදනය කිරීමේ හැකියාව.

(73) පෙරදිග තූර්යවාදක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු අතර (කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 22ට නොවැඩි විය යුතුය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම. වයලින්, වියෝලා, චෙලෝ, සිතාර්, බටනලා, සන්තූර්, එක්ස්රාජ්, මැන්ඩලින් යන සංගීත භාණ්ඩවලින් 01 ක් හෝ කිහිපයක් වාදනය කිරීමේ හැකියාව සහ සිංහල, ඉංග්‍රීසි, දෙමළ හා හින්දි භාෂාවලින් ගීත ගායනා කිරීමේ හැකියාව සහ ඕගන් ගිටාර් වාදනය කිරීමේ හැකියාව.

(74) කෘෂිකර්ම ප්‍රදර්ශක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු අතර (කාන්තා) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 22ට නොවැඩි විය යුතුය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඇ) රජයේ පිළිගත් කෘෂිකාර්මික පාසල් හෝ ආයතනයක් මඟින් සත්ව පාලනය, බෝග වගාව පිළිබඳව පාඨමාලාවක් හදාරා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

(75) ට්‍රැක්ටර් ක්‍රියාකරු - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඇ) බර වාහන/ ඉඩම් වාහන පැදවීමේ රියදුරු බලපත්‍රය ලබා තිබිය යුතුය.

(76) කෘෂිකර්ම උපදේශක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය:

(අ) සැරයන් (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) අ.පො.ස (උ/පෙළ) සමත් විය යුතුය.
(ඇ) වසර 02කට නොඅඩු පූර්ණ කාලීන කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාවක් (NVQ LEVEL VI) සහ අවුරුදු 02කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබිය යුතුයි.

(77) කෘෂිකර්ම ප්‍රදර්ශක - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය:

(අ) කෝප්‍රල් (පිරිමි) 2025 දෙසැම්බර් මස 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) අ.පො.ස (සා/පෙළ) සමත් විය යුතු අතර, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු (NVQ LEVEL IV) මට්ටමේ පාඨමාලාවක් හෝ ඊට සමාන සහතිකයක් ලබා තිබීම.
(ඇ) අවුරුදු 01කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබිය යුතුයි.

3. සේවා කොන්දේසි:

අ. පුහුණු කාලසීමාව අවසානයේ (පිරිමි/ කාන්තා) සිට වසර 05 ක් යුද්ධ හමුදා සේවයේ රාජකාරි අනිවාර්යෙන් ඉටුකළ යුතු බැවින් වසර 12ක සේවා කාලයක් සඳහා සේවය කරන්නේ නම් ඉදිරි වසර 07 සඳහා සේවය දීර්ඝ කිරීම සඳහා වූ වෛද්‍ය පරීක්ෂණයකට සහභාගි වී ඉන් සමත් විය යුතුය.

ආ. වසර 12ක සේවාකාලය සම්පූර්ණ කරනු ලබන (පිරිමි) සෙසු නිලයන් වසර 22ක් දක්වා සේවය කරනු ලබන්නේ නම් සේවය දීර්ඝ කිරීම සඳහා නැවත වෛද්‍ය පරීක්ෂණයකට සහභාගි වී ඉන් සමත් විය යුතුය.

4. වැටුප් හා දීමනා, සේවා කොන්දේසි සහ පහසුකම්:

අ. පුහුණුවීම් කාලසීමාවෙන් පසු ආධුනික සෙබළ සෙබළියන්ගේ මාසික වැටුප රු. 88,915.90 කි. (සියලු දීමනා සහිතව)

ආ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ ආධුනික ආරම්භක නිලයේ සිට විශ්‍රාම යන තෙක් එයට අදාළ වන පහත දැක්වෙන වැටුප් තලයෙහි/පරිමාණයෙහි තබනු ලැබේ.

| නිලය | මුදල (රු.) |
|---|---|
| සාමාන්‍ය සෙබළ | 88,915.90 |
| ලාන්ස් කෝප්‍රල් | 90,065.90 |
| කෝප්‍රල් | 91,515.90 |
| සැරයන් | 92,555.90 |
| මාණ්ඩලික සැරයන් | 93,895.90 |
| බලලත් නිලධාරි II | 95,255.90 |
| බලලත් නිලධාරි I | 99,380.90 |

ඇ. වැටුප් හා ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි සෙසු නිලයන්ට බලපවත්වනු ලැබේ:

(1) යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය
(2) අංක 939/16 දරන 1996 සැප්තැම්බර් 03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළකර ඇති 1994 අංක 01 දරන සෙබල සේවා නියෝගය
(3) අංක 528/15 දරන 1988 ඔක්තෝබර් 21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළකර ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා නියෝගය
(4) 1989 ජුනි 15 වන දින අංක 562/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂිත ව්‍යවස්ථා සංග්‍රහය.

5. අනෙකුත් දීමනා :

අ. පහත සඳහන් මාසික දීමනා ගෙවනු ලැබේ :

(1) සුදුසුතා දීමනා
(2) නොමිලේ ආහාර හෝ ආහාර දීමනා
(3) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාව (විවාහක අයවළුන් හට පමණි).
(4) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනා

ආ. පහත සඳහන් පහසුකම්/ දීමනා ගෙවනු ලැබේ :

(1) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්
(2) ගෙවල් කුළී දීමනා
(3) නොමිලේ නිල ඇඳුම්
(4) නිවාඩු යෑම සඳහා නිවාඩු දුම්රිය බලපත්‍ර/ බස් ගමන් බලපත්‍ර
(5) වෛද්‍ය පහසුකම්
(6) විවාහක නිවාස පහසුකම්
(7) වාර්ෂික වැටුප් වර්ධක
(8) සුභසාධක දීමනා/ පහසුකම්
(9) ගමනාගමන සඳහා රථවාහන පහසුකම්
(10) රක්‍ෂණ වන්දි හා මරණාධාර
(11) ණය පහසුකම්
(12) විශ්‍රාම වැටුප්

6. සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීම:

අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදා සේවය සඳහා එක්වීමට සියලු සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් හා අයදුම්කාරියන් යුද්ධ හමුදාවේ රෙජිමේන්තු මධ්‍යස්ථාන මගින් මූලික සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව තෝරාගැනීම සිදුකරනු ලැබේ. ඉහතින් සඳහන් පරිදි එක් එක් වෘත්තිය සඳහා එක් එක් රෙජිමේන්තුවලට ආවේණික ක්‍රමවේදයන්ට අනුව සම්මුඛ පරීක්‍ෂණ පවත්වන ආකාරය වෙනස්විය හැකිය (උදා.- කමාන්ඩෝ රෙජිමේන්තුව හා විශේෂ බලකාය). එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන් වෙතින් ලබා ගන්නා ලිපිලේඛන රෙජිමේන්තු මධ්‍යස්ථාන මගින් පිරිස් පරිපාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත යොමු කිරීමෙන් පසු පිරිස් පරිපාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙතින් පරීක්‍ෂාවකට ලක් කොට සුදුසුකම් සපුරා ඇති සහ ලිපි ලේඛන නිවැරදිව භාරදී ඇති අයදුම්කරුවන් හා අයදුම්කාරියන් පමණක් යුද්ධ හමුදාව වෙත බඳවා ගැනීමට තෝරා ගනු ලැබේ.

ආ. තෝරාගනු ලබන අයදුම්කරුවන් හා අයදුම්කාරියන් හට වෛද්‍ය පරීක්‍ෂණ පවත්වනු ලබන ස්ථානය, දිනය සහ වේලාව විද්‍යුත් ලිපිනයට හෝ දුරකථන මාර්ගයෙන් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණය රෙජිමේන්තු සම්බන්ධතාවයෙන් සිදුකරනු ලබන අතර, මේ සම්බන්ධයෙන් ඔබ විසින් දරනු ලබන ගමන් වියදම් හෝ වෙන කිසියම් හෝ වියදමක් යුධ හමුදාව මගින් දරනු නොලැබේ.

ඇ. අයදුම්කරුවෙකු බඳවා ගැනීමට නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුගේ ඇති සුදුසුකම් හා වෙනත් හැකියාවක් පිළිබඳ අවධානය යොමු කර සහතිකයක් නිකුත් කර දීමෙනි. අයදුම්කරුවන් තෝරා ගැනීමේ දී කවරාකාරයකින් හෝ නුසුදුස්සෙකු තෝරා ගැනීම සඳහා පෙළඹවීම, නැතහොත් බලපෑම් කිරීමට උත්සහ දැරීම නොකළ යුතුය.

ඈ. ආරක්‍ෂක අංශයන්හි රාජකාරිවල නිරතව සේවයෙන් ඉවත්ව ගිය හෝ වෙනත් හේතූන් මත ඉවත්කරනු ලැබූ පුද්ගලයන් හට නැවත සේවයට එක් වීමට හෝ සේවයට බැඳීමට හැකියාවක් නොමැත.

7. ඉල්ලුම්පත්‍ර : ඉල්ලුම්පත්‍ර මේ සමඟ ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව ඉල්ලුම්කරුගේ ම අත් අකුරින් සම්පූර්ණ කර පිරිස් පරිපාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්‍ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල යන ලිපිනයට හෝ අයදුම්කරු පදිංචි ප්‍රදේශයේ ළඟම ඇති යුද්ධ හමුදා කඳවුරක් වෙත භාරදිය යුතුවේ. ඉල්ලුම් පත්‍ර භාරගනු

ලබන අවසාන දිනයට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. මේ පිළිබඳ වැඩි විස්තර සහ අයදුම්පත www.army.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

8. *අනන්‍යතාවය තහවුරු කිරීම* : අපේක්ෂකයන් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් වාහන කොමසාරිස් ජෙනරාල්වරයා විසින් නිකුත් කරන ලද 'රියදුරු බලපත්‍රය' පිළිගනු ලැබේ.

9. *භාෂා අවශ්‍යතා* : ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මතු පවතිනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව තෝරාගත් අපේක්ෂකයින් ක්‍රියා කළ යුතුවේ.

10. ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් එවිය යුතුයි:

අ. උප්පැන්න සහතිකය
ආ. අධ්‍යාපන සහතික
ඇ. පාසල් හැරයාමේ සහතිකය
ඈ. ග්‍රාම නිලධාරි සහතිකය
ඉ. පොලිස් නිශ්කාෂණ සහතිකය
ඊ. ක්‍රීඩා හා විෂයය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික

උ. අයදුම්කරු පිළිබඳ දන්නා (චරිත සහතිකයක් නිකුත් කළ හැකි අයකුගෙන්) පුද්ගලයන්ගෙන් මෑතක දී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක් හා අයදුම්කරු අවසන්වරට ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිගෙන් ලබා ගන්නා ලද චරිත සහතිකයක් තිබිය යුතුවේ.
ඌ. වෘත්තීන්ට අදාළව හදාරනු ලැබූ පාඨමාලා සහතික
එ. ජාතික හැඳුනුම්පත/ තැපැල්පති විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත/ රියදුරු බලපත්‍රය

*සටහන* : මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළ වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

බී කේ ජී එම් එල් රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ්-එන්ඩීයූ පීඑස්සී අයිජී
ලුතිනන් ජෙනරාල්
යුද්ධ හමුදාධිපති

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

2025 මාර්තු මස 23 වැනි දින.

*නොගැලපෙන වචන කපා හරින්න.*

**වෘත්තීය/ වෘත්තීය නොවන රාජකාරි සඳහා ආධුනික සෙබළ සෙබළියන් බඳවා ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම**

1. සම්පූර්ණ නම : ……………………………………………………………………………………………...................
.........................................................................................................................................................
2. ලිපිනය :………………………………………………………………………………………….................................
……………………………………………………………………………………………….......................
3. උපන් දිනය :…………………………………………………………………………………………...........
4. ජාතිය :……………………………….……………………………………………………………...........
5. ආගමම :………………………………...…………………………………………………………….............

6. ස්ත්‍රී/ පුරුෂ භාවය :.................................................................................................................
7. උස :.........................................................................................................................................
8. පපුවේ ප්‍රමාණය :.......................................................................................................................
9. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................................
10. භාරකරුගේ නම සහ දුරකතන අංකය :.............................................................................................
11. අධ්‍යාපන සුදුසුකම් :..................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
12. ඉගෙනුම ලැබූ පාසල :................................................................................................................
13. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය :...................................................................................................
14. ලබා ඇති වෘත්තීය පුහුණු :..........................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
15. වෘත්තීය පුහුණු ආයතනය සහ කාලසීමා :........................................................................................
.....................................................................................................................................................
16. වෘත්තීය නිපුණතාවය අනුව තිබෙන පළපුරුද්ද පිළිබඳ විස්තරය (කාලසීමාවන් සඳහන් කළ යුතුයි) ..........................
.....................................................................................................................................................
.....................................................................................................................................................
17. මීට පෙර රැකියාවක් කර තිබේනම් එම ආයතනය/ ස්ථානය හා එම රැකියාවේ නිරත වූ කාලසීමා :........................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
18. තෝරාගන්නා ලද වෘත්තිය අනුව රාජකාරි කිරීමට ඇති කැමැත්ත :...................................................................
.....................................................................................................................................................
19. ශ්‍රී ලංකාව තුළ රාජකාරි කිරීමට කැමැති ප්‍රදේශ :.............................................................................
.....................................................................................................................................................
20. අයදුම්කරන වෘත්තියට අමතරව හදාරා ඇති පාඨමාලාවන් හා වෙනත් සුදුසුකම් :...................................................
.....................................................................................................................................................
21. ක්‍රීඩා සුදුසුකම් :.......................................................................................................................
22. ළඟම පොලිසිය :.......................................................................................................................
23. ඡන්ද කොට්ඨාසය :....................................................................................................................
24. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.....................................................................................................
25. ග්‍රාම නිලධාරී වසම :.................................................................................................................
26. ළඟම තැපැල් කාර්යාලය :............................................................................................................
27. දුරකතන අංකය :.......................................................................................................................
28. විවාහක/ අවිවාහක බව :.............................................................................................................

ඉහත විස්තර නිවැරදි බවට සහතික කරමි.

දිනය :- ........................

........................,
ප්‍රකාශකයාගේ අත්සන.

04-162